# ලක්දිව තෙවරක් රජ වූ ලීලාවතී රැජින

ජේ.ඇම්. සුධර්මාවතී[1]

ලංකා ඉතිහාසයේ විවිධ කාල පරිච්ඡේද පරීක්ෂා කිරීමේදී දේශපාලන පසු බිමෙහි සාමකාමී තත්ත්වයන් මෙන්ම අර්බුද පැන නැගී පැවති අවධීන් ද දැකිය හැකි ය. සියවස් දෙකකට ආසන්න කාලයක් පැවති පොලොන්නරු රාජධානි සමයේ මෙම ලක්ෂණ දෙකේ ම උච්චතම අවස්ථාවන් දක්නට ලැබේ. මේ අවධියේ ලංකා ඉතිහාසයේ කැපී පෙනෙන ශ්‍රේෂ්ඨ පාලකයන් දෙදෙනෙකු වූ පළමුවන විජයබාහු හා පළමුවන පරාක්‍රමබාහු යන රජවරුන් දවස සාර්ථක පාලන පසුබිමක් පැවතිණි. පළමුවන පරාක්‍රමබාහුගේ අනුප්‍රාප්තිකයන් පිළිබඳ පරීක්ෂා කිරීමේ දී ලීලාවති රැජින තෙවරක්ම සිංහාසනයට උරුමකම් කියා තිබේ.

මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ ලීලාවතී රැජින පිළිබඳව ඇති ප්‍රාථමික මූලාශ්‍රයන්යහි හා ද්විතීයික මූලාශ්‍රයන්යහි එන තොරතුරු පිළිබඳ නැවත විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීමයි. ඇය පළමුවන පරාක්‍රමබාහු රජතුමාගේ අගමෙහෙසිය වූවා ය. මිත්තා කුමරිය හා පාණ්ඩ්‍ය කුමාරයාගේ පුත්‍රයකු වූ සිරිවල්ලභගේ දියණිය වූ ඇය පිය පාර්ශවයෙන් පාණ්ඩ්‍ය වංශයට අයත් වූවාය. තෙවරක් සිංහාසනයට පත් වූ එකම පාලකයා ලෙස ඉතිහාස ගත ලීලාවතී රැජිනට එක් අවස්ථාවකදීවත් දීර්ඝ කාලයක් සිහසුනේ රැඳී සිටීමට නොහැකි විය.

මෙම පර්යේෂණයේදී අනුගමනය කළ ක්‍රමවේදය වූයේ ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍ර පදනම් කරගෙන අධ්‍යයනය කිරීමයි. එහිදී ප්‍රධාන වශයෙන්ම දේශපාලන ක්ෂේත්‍රයේ දුර්වල ලක්ෂණ පෙන්නුම් කළ කාලවකවානුවක් පැවති බව පැහැදිලිවම හඳුනාගත හැකිය. දුර්වල පාලකයන් රජ වීම, රජුන් අභිභවා සේනාපතිවරුන් හා ඇමතිවරුන් බලවත්වීම, කාලිංග පාණ්ඩ්‍ය බල අරගලය වැනි දේශපාලන තන්ත්‍රය තුළ පරිහානිය කරා ගමන් ගන්නා ලක්ෂණ හඳුනා ගත හැකි වන අතර ලීලාවතී රැජින එහිදී කාලවකවානු තුනක් තුල එක්තරා භූමිකාවක් නිරූපනය කරන අයුරු පැහැදිලි වේ.

[1] ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්ව විද්‍යාලය, කැලණිය
ඊමේල්: Sudharma_wanninayake@yahoo.com

**පාරිභාෂිත වචන:**

**Keywords:**